**ශීර්ෂය 162 - මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය පිළිබඳ විගණකාධිපති වාර්තාව 2017 වර්ෂය**

---

2017 අංක 32 දරන විසර්ජන (සංශෝධන) පනතින් සංශෝධිත 2016 අංක 24 දරන විසර්ජන පනතේ පළමුවන උපලේඛනයේ හා තෙවන උපලේඛනයේ සඳහන් ශීර්ෂය හා විෂය අංකය යටතේ වන විසර්ජන ගිණුම, සැසඳුම් ප්‍රකාශය, මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය විසින් විගණනයට ඉදිරිපත් කරන ලදී. එම ගිණුමෙන් හා සැසඳුම් ප්‍රකාශයෙන් නිරූපනය වන මූල්‍ය හා භෞතික කාර්යසාධනය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සාමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව ප්‍රකාරව විගණනය කරන ලදී.

## 1.2 ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ මූල්‍ය කළමනාකරණය හා ගිණුම් කටයුතුභාවය පිළිබඳ වගකීම

---

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 124 ප්‍රකාරව රාජ්‍ය මුදල් ඉපැයීම සහ රජයට ලැබිය යුතු මුදල් එකතු කිරීම මෙන්ම රජයේ සියළුම මුදල් කටයුතු අධීක්ෂණය පිළිබඳ පොදු අවේක්ෂණයද මුදල් අමාත්‍යවරයා වෙත පැවරී ඇත. මුදල් අමාත්‍යවරයා විසින් එම වගකීම ඉටු කිරීම පිණිස මුදල් රෙගුලාසි 124(2) ප්‍රකාරව ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන් පත් කර ඇත. පාර්ලිමේන්තුව විසින් පනවන ලද සීමාවන් ඇතුළත තම කාර්යභාරයන් ඉටු කර ඉදිරිපත් කරනු ලබන ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රජයේ මුදල් රෙගුලාසි හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට ආදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 1.3 විගණන විෂය පථය

---

ශීර්ෂය 162 - මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශයේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය හා භෞතික කාර්යසාධනය සම්බන්ධයෙන් සැලැසුම් කිරීම, රාජ්‍ය වියදම්, රාජ්‍ය ආදායම්, මානව හා භෞතික සම්පත් කළමනාකරණය, අභ්‍යන්තර පාලන විධිවිධාන යොදා ගැනිම, නීති,රීති හා රෙගුලාසිවලට අනුකූලවීම හා පොත්පත්, ලේඛන, වාර්තා හා සැසඳුම් ප්‍රකාශන යාවත්කාලීන කර පවත්වා ගැනීම, ගිණුම් පිළියෙල කර කාලීනව ඉදිරිපත් කිරීම, කාර්යසාධන දර්ශක පදනම් කරගෙන අදාළ පාර්ශවයන් වෙත කාර්යසාධන වාර්තා නිකුත් කිරීම පිළිබඳව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව යථා කාලයේදී අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත නිකුත් කිරීමට නියමිතය. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනිම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද සැලැසුම්, ගිණුම්, සැසඳුම් ප්‍රකාශන හා කාර්යසාධන වාර්තා පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

## 1.4 විගණන නිරීක්ෂණය

---

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශයේ සිදු කරන ලද විගණනයේදී අනාවරණය වූ ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ මෙම වාර්තාවේ 2.1 ඡේදයේ සිට 2.13 දක්වා ඡේදවල සඳහන් කර ඇත. මූල්‍ය පරිපාලනයේ ප්‍රමාණවත් බව තහවුරු වන පරිදි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 127 හි සඳහන් විධිවිධාන ඉටු කිරීමේදී අනාවරණය වූ පහත සඳහන් සටහනේ සාරාංශගත

කර දක්වා ඇති විගණන නිරීක්ෂණවලට යටත්ව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වශයෙන් තම ගිණුම් කටයුතුභාවය සතුටුදායක ලෙස ඉටු කර තිබුණු බව නිරීක්ෂණය විය.

| **මුදල් රෙගුලාසි 127 ප්‍රකාර ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ ගිණුම් කටයුතුභාවය** | | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරී එම විධිවිධානයට අනුගත වී නොතිබීම** | **නිරීක්ෂණය ඇතුළත් වාර්තාවේ ඡේද යොමුව** |
|---|---|---|---|
| **මුදල් රෙගුලාසිය** | | | |
| 127 (1)(අ) | නිවැරදිව සහ මූල්‍ය විධිමත් බවෙන් යුක්තව කටයුතු කරන බව තහවුරුවන පරිදි සියළු මූල්‍ය කාර්යයන් සැලැසුම් කළ යුතු වීම. | 1. දැක්ම හා මෙහෙවර මගින් කාර්යභාරය විස්තර නොවීම | 2.1 |
| | | 2. ක්‍රියාකාරී සැලැස්මේ අඩුපාඩු | 2.2.1 |
| 127(1)(ආ) | වියදම් සහ රාජ්‍ය ආදායම් එකතු කිරීම පිළිබඳව ප්‍රමාණවත් තරම් පාලනයකට විධිවිධාන සැලැසෙන ක්‍රමයක් සම්පාදනය කළ යුතුවීම. | 1. අනාර්ථික ගනුදෙනු | 2.8 |
| | | 2. කළමනාකරණ දූර්වලතා | 2.10 |
| | | 3. අනුකූල නොවීම් | 2.12 |
| | | 4. මානව සම්පත් කළමනාකරණයේ අඩුපාඩු | 2.13 |
| 127(2) | තමාගේ පාලනය යටතේ පවත්නා දෙපාර්තමේන්තුවල එවකට තිබෙන වැය විෂයයන් මෙන්ම අළුතින් හෝ වැඩියෙන් වියදම් කිරීම සඳහා වන යෝජනා සැකසුරුවම්කම හා කාර්යක්ෂමතාවය අතින් අමාත්‍යාංශයේදී තියුණු පරීක්ෂාවකට භාජනය කිරීම. | 1. අපේක්ෂිත නිමැවුම් මට්ටම ලබා නොගැනීම | 2.2.2 |
| | | 2. අපේක්ෂිත ප්‍රතිඵල ලබා නොගැනීම | 2.2.3 |
| | | 3. ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන් | 2.2.4 |
| | | 4. මුදල් නිදහස් කර තිබුණත්, ප්‍රගතියක් ලබා නොතිබුණු ව්‍යාපෘති | 2.2.5 |
| | | 5. කාල පමාවකින් පසු වැඩ ආරම්භ කළ ව්‍යාපෘති | 2.2.6 |
| | | 6. විදේශාධාර ව්‍යාපෘතිවල කාර්යසාධනය | 2.3(අ) |
| | | 7. විදේශාධාර ව්‍යාපෘතිවල මුදල් උපයෝජනය නොකර තැන්පත් ගිණුම්වල රඳවා ගැනිම | 2.3(ආ) |

| | | | |
|---|---|---|---|
| | | 8. විදේශාධාර ව්‍යාපෘති නියමිත දිනයට ආරම්භ නොකිරීම | 2.3(ඇ) |
| | | 9. විදේශාධාර ව්‍යාපෘති ඇවර කිරීම | 2.3(ඇ) |
| | | 10. ප්‍රසම්පාදන ක්‍රියාවලිය මගින් සැපයීම් හා සේවා ලබා ගැනීමේදී වූ අඩුපාඩු | 2.4 |
| 127(3) | ස්වකීය පරිපාලනාත්මක කෘතහස්තතාව හා විචාර බුද්ධිය මෙහෙයවා සුදුසු පරිදි ක්‍රියා කළ හැකි වන පිණිස සැකැයක් හෝ උද්ගත වී ඇති සියළු ප්‍රශ්ණ තමා වෙත ඉදිරිපත් වෙන ආකායරක් සලසා තිබීම. | 1. වාහන උපයෝජනයේ අඩුපාඩු | 2.5.1 |
| | | 2. නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම් | 2.5.2 |
| | | 3. වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීමේ අඩුපාඩු | 2.5.3 |
| | | 4. බාහිර පාර්ශවයන් වෙත නිකුත් කර තිබුණු වත්කම් | 2.5.4 |
| | | 5. විසඳා නොතිබුණු විගණන ඡේද | 2.9 |
| 127(4) | තමාගේ එක් එක් ගණන්දීමේ නිලධාරීයා විසින් විසර්ජන ගිණුම් විධිවූ පරිදි ඉදිරිපත් කරන බවට හා තමා ඒවා අත්සන් කිරීමට පෙර අමාත්‍යාංශයේදී පරීක්ෂා කරනු ලබන බවටත්, එසේම ඇස්තමේන්තුවල ප්‍රතිපාදිත මුදල සහ තථ්‍ය වියදම අතර පවත්නා සැලැකිය යුතු වෙනස්කම් තමා විසින්ම, දැඩි ලෙස විමර්ශනයට භාජනය කරන බව, | ප්‍රතිපාදන ඉක්මවා බැදීම්වලට එළඹීම | 2.6 |
| 127(5) | දෙපාර්තමේන්තුවේ ඇස්තමේන්තුවල ප්‍රතිපාදිත මුදල හා වියදම අතර ඇති සැලැකිය යුතු වෙනස්වීම් අමාත්‍යාංශයේ දැඩි ලෙස පරීක්ෂණයට භාජනය කෙරෙන බව, | 1. සලසා තිබුණු ප්‍රතිපාදන උපයෝජනය නොකිරිම | 2.11(අ) |
| | | 2. අධි ප්‍රතිපාදන සලසා තිබීම | 2.11(ආ) |

| | | | |
|---|---|---|---|
| 127(7) | නිලධාරීන්ගේ/සේවකයින්ගේ ප්‍රමාදය, නොසැලැකිල්ල, වරද හෝ වංචාව නිසා රජයට පාඩු සිදු වී ඇති අවස්ථාවලදී මුදල් රෙගුලාසි 103 සිට 108 දක්වා රෙගුලාසිවල නියම කර ඇති කාර්ය පරිපාටිය ගණන්දීමේ නිලධාරීන් විසින් අනුගමනය කරනු ලබන බවටද, මුදල් රෙගුලාසි 156(1) අනුව එම පාඩු සම්බන්ධයෙන් වගකිව යුතු නිලධාරීන්/සේවකයන් මත අධිභාර පැනවීමද, වගබලා ගැනීම පිණිස විධිවිධාන යොදන ලද්දේනම් තමා වෙත පැවැරී ඇති වගකීම්වලින් ගණන්දීමේ නිලධාරියා නිදහස් වූවාක් ලෙස සලකනු ලැබේ. රාජ්‍ය ගිණුම් කාරක සභාව හමුවේ පෙනී සිට, තමා වගකීම් දරන දෙපාර්තමේන්තුවල ගිණුම් පැහැදිලි කිරීමෙන් හා සාධාරණීය කිරීමෙන් ගණන්දීමේ නිලධාරියා සමඟ සහාය වීමද ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ රාජකාරී භාරයක් වීම. | පාඩු හා හානි | 2.7 |

## 2. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ

### 2.1 අමාත්‍යාංශයේ දැක්ම හා මෙහෙවර

අමාත්‍යාංශයේ දැක්ම හා මෙහෙවර තුළින් ඉටු කරනු ලබන කාර්යභාරය විස්තර කර නොතිබුණි.

### 2.2 කාර්යසාධනය

#### 2.2.1 සැලැසුම් කිරිම

2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව 2017 වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කර තිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂයේදී අමාත්‍යාංශය විසින් ඉටු කළ යුතු ප්‍රධාන කාර්යභාරයන් 28 ක් පැවැති අතර, අමාත්‍යාංශය යටතේ ස්ථාපිත කර ඇති ව්‍යවස්ථාපිත

ආයතන 02 ක හා විදේශ ව්‍යාපෘති 04 න් අපේක්ෂිත ප්‍රතිඵල ලබා ගැනීම සඳහා පිළියෙල කර තිබුණු ක්‍රියාකාරී සැලැසුම සම්බන්ධයෙන් පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂයට අදාළ වාර්ෂික අයවැය පදනම් කර ගත් ප්‍රමුඛතා අනුව සකස් කළ ක්‍රියාකාරකම් සැලැස්ම (Activity Plan), ක්‍රියාත්මක කළ කාල රාමුව (Time Line) හා එම ක්‍රියාකාරකම්වල අපේක්ෂිත නිමවුම්/ ප්‍රතිඵල (Output/ Outcome) ඇස්තමේන්තු කර සඳහන් කර නොතිබුණි.

(ආ) විධිමත් සැලැස්මක් නොතිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේදී උපායශීලි නගර සංවර්ධන ව්‍යාපෘතිය යටතේ යාපනයේ නගර සංවර්ධන ව්‍යාපෘතියේ ඉඩම් අත්පත් කරගැනීම හා නැවත පදිංචි කිරීමේ කාර්යයන් සඳහා රු.මිලියන 335 කට සමාන එ.ජ.ඩො.මිලියන 2.17 ක ප්‍රතිපාදන සලසා තිබුණි. විධිමත් සැලැස්මක් නොතිබීම නිසා සමාලෝචිත වර්ෂය අවසන් වන විට එම ප්‍රතිපාදනවලින් රු.මිලියන 44.72 කට සමාන එ.ජ.ඩො. මිලියන 0.29 ක් පමණක් උපයෝජනය කර තිබුණි.

(ඇ) අනුරාධපුර ඒකාබද්ධ නගර සංවර්ධන ව්‍යාපෘතිය මගින් සංස්කෘතික හා ස්වභාවික උරුමයන් රැකගනිමින් අනුරාධපුර නගරයේ පෞරාණික හා නවීකරණය වූ ප්‍රදේශ අතර සමබර සංවර්ධනයන් ප්‍රවර්ධනය කිරීම සඳහා රු.මිලියන 9,779.95 කට සමාන යූරෝ මිලියන 62.4 ක පිරිවැය ඇස්තමේන්තු කර තිබුණි. එම ඇස්තමේන්තුගත වියදමෙන් රු. මිලියන 8,150 කට සමාන යූරෝ මිලියන 52 ක් ප්‍රංශ සංවර්ධන නියෝජිත ආයතනය විසින් ලබාදීමට එකග වී තිබුණි. 2016 වර්ෂයේදී ආරම්භ කර තිබුණු මෙම ව්‍යාපෘතිය සඳහා සමාලෝචිත වර්ෂයේදී රු.මිලියන 52.01 ක් හෙවත් යූරෝ මිලියන 0.33 ක් වැයකර තිබුණි. කෙසේවුවද, සමස්ථ ව්‍යාපෘතියේ කාලය ආවරණය වන පරිදි ක්‍රියාකාරී සැලැස්මට අනුකූලව අයවැය ලේඛනයක් පිළියෙල කර නොතිබුණි. එසේම ව්‍යාපෘතිය යටතේ කරගෙන යන සිවිල් වැඩ සඳහා විස්තරාත්මක නිර්මාණ සැලැස්මක් සකස්කිරීමේ ප්‍රමාදය මත සමාලෝචිත වර්ෂය සඳහා වූ ප්‍රසම්පාදන සැලස්මක්ද පිළියෙල කර නොතිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම අනුව සුභිත පුරවර ව්‍යාපෘති පළමු, දෙවන අදියරයන් සහ නව ව්‍යාපෘති වශයෙන් පිළිවෙලින් රු.මිලියන 1,750 ක්, රු.මිලියන 2,350 ක් හා රු.මිලියන 1,000 ක් වශයෙන් එකතුව රු.මිලියන 5,100 ක් උපයෝජනය කර තිබුණි. සුභිත පුරවර පළමුවන අදියරේ ව්‍යාපෘති 64 කටද, දෙවන අදියරේ ව්‍යාපෘති 47 කටද, එසේම නව ව්‍යාපෘති 11 ක්ද වශයෙන් එකතුව ව්‍යාපෘති 122 ක් සඳහා නගර උපාංග හා නාගරික ඝන අපද්‍රව්‍ය කළමනාකරණ උපාංගය යටතේ නිම කිරීමට සැලැසුම් කර තිබුණි. එහෙත් සමාලෝචිත වර්ෂය අවසන් වන විට ව්‍යාපෘති 81 ක වැඩ අවසන් කිරීමට නොහැකි වී තිබුණි.

### 2.2.2 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම

----------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය අවසන් වන විට සංවර්ධනය කළ යුතු නාගරික සංවර්ධන කළාප 243 ක් හඳුනාගෙන තිබුණි. මහනගර සභා බල ප්‍රදේශ 08 ක්ද, නගර සභා බල ප්‍රදේශ 12 ක් හා ප්‍රාදේශීය සභා බල ප්‍රදේශ 20 ක් වශයෙන් එකතුව කළාප 40 ක පමණක් සංවර්ධන සැලැසුම් පිළියෙල කර තිබුණි.

(ආ) කොළඹ අගනගර ආශ්‍රිතව ජලගැලීමෙන් පසු යථා තත්ත්වයට පත්වන නාගරික පරිසරය උදෙසා වූ භාර අරමුදල යටතේ ජාත්‍යන්තර උපදේශක ආයතනයක් මගින් කොළඹ අගනගර ආශ්‍රිත ගංවතුර අවදානම අවම කිරීම සඳහා ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර තිබුණි. එම

සැලැසුම් පැකේජය තුළ ශ්‍රී ලංකාවේ අදාළ ආයතනවල නිලධාරින් සඳහා වැඩමුළු පවත්වා එකී ක්‍රියාකාරි සැලැස්ම පිළියෙල කිරිමට අවශ්‍ය පුහුණුව ලබා දීමට කටයුතු කර තිබුණි. එහෙත් ශ්‍රී ලංකාවේදී නිලධාරින් පුහුණු කිරීම ක්‍රමානුකූලව සහ විධිමත්ව සිදුකර නොතිබීම නිසා ඒ වෙනුවෙන් වැයකරන ලද මුදල නිෂ්ඵල වී තිබුණි. මේ නිසා අදාළ ක්‍රියාකාරී සැලසුම් පිළියෙල කිරිම සඳහා නැවත නැවත ජාත්‍යන්තර උපදේශන සමාගම්වල සහය ලබාගැනීමට සිදුවි තිබුණි.

(ඇ) බස්නාහිර කළාපීය මහනගර සැලැසුම් ව්‍යාපෘතිය පවත්වාගෙන යන කාලරාමුවක් පිළියෙල කර නොතිබුණි. ජාතික භෞතික සැලැසුම් දෙපාර්තමේන්තුව විසින් ඉටු කරනු ලබන කාර්යභාරයන් මෙම ව්‍යාපෘතිය මගින්ද ඉටු කර තිබුණි. බස්නාහිර කළාපීය මහානගර අධිකාරිය පිහිටුවීමේ පනත් කෙටුම්පත සැකසීම හා ඊට බලපාන පළාත්පාලන අණපනත් සංශෝධනය කිරිම, පළාත් පාලන ආයතන අතර ඇතිවන ගැටළු විසඳීම හා බස්නාහිර පළාත් මහානගර අධිකාරියේ ව්‍යුහය පිළිබඳව පූර්ව සැලැසුම් සකස් කිරිම මෙම ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණු වී තිබුණද ව්‍යාපෘතිය, එම අරමුණුවලින් බැහැරව කටයුතු කර තිබුණි.

(ඈ) කොළඹ අගනගර ආශ්‍රිත නාගරික සංවර්ධනව්‍යාපෘතිය යටතේ ඉදිකළ බැද්දගාන ජෛව විවිධත්ව උද්‍යානයේ ඉදිකිරීම් කටයුතු නියමිත ප්‍රමිතිවලට අදාළව සිදුකර නොතිබුණි. ප්‍රමාණ පත්‍රවල සඳහන් කර තිබුණු ඉටු නොකළ වැඩ කොටස් වැඩිපුර දැක්වීම හා ප්‍රමිතීන්ට අනුකූල නොවන ලෙස ඉටු කර තිබුණු කාර්යයන් වෙනුවෙන් ගෙවීම් කිරීම නිසා කොන්ත්‍රාත්කරු වෙත රු.මිලියන 92.07 ක් වැඩිපුර ගෙවා තිබුණි.

(ඉ) මට්ටක්කුලිය කාක දූපත වෙරළ උද්‍යානය රු.මිලියන 275.78 ක වටිනාකමකට මාස 10 ක් තුළ ඉදිකිරීම සඳහා කොන්ත්‍රාත්කරු සමඟ කොළඹ අගනගර ආශ්‍රිත නාගරික සංවර්ධන ව්‍යාපෘතිය (MCUPP) ගිවිසුමකට එළඹ තිබුණි. නමුත් ව්‍යාපෘතිය නිම කිරීමට වර්ෂ 1½ කට වැඩි කාලයක් ගත කර තිබුණි. ව්‍යාපෘතියේ ඇතැම් අයිතමයන් ඉංජිනේරු සැලැස්මට අනුකූලව ඉදිකර නොතිබුණු අතර, නියමිත ප්‍රමිතිවලට අනුකූලව ඉදිකිරීම් සිදු නොකළ අඩුපාඩු 47 ක් පැවැතුණි. එම අඩුපාඩු පිළිබඳව සලකා බැලීමෙන් තොරව උද්‍යානය භාර ගෙන තිබුණු අතර, එම අඩුපාඩුකම් පිළිබඳව සලකා බැලීමකින් තොරව කොන්ත්‍රාත්කරු වෙත රු.මිලියන 129.14 ක් ගෙවා තිබුණි.

(ඊ) අයිකොනික් ගොඩනැගිල්ල ඉදිකිරීම, ඌරුබොක්ක නගර සංවර්ධන ව්‍යාපෘතිය හා හම්බන්තොට සිරිබෝපුර වානිජ හා වෙරළ උද්‍යානය ඉදිකිරීම සඳහා සමාලෝචිත වර්ෂයේදී පරිපූරක ඇස්තමේන්තු වෙන්කිරීම් මගින් රු. මිලියන 607.98 ක ප්‍රතිපාදන සලසාගෙන තිබුණි. නමුත් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් එම ඉදිකිරීම් කටයුතුවල භෞතික හෝ මූල්‍ය ප්‍රගතියක් අත්කරගෙන නොතිබුණි.

(උ) තාක්ෂණික නගර සංවර්ධන ව්‍යාපෘතිය යටතේ මාලඹේ, හෝමාගම, කඩුවෙල සහ අතුරුගිරිය යන නගර සංවර්ධනය කිරිමට යෝජනා වී තිබුණි. ඒ අනුව තෘතීය අධ්‍යාපන කළාපය, විද්‍යාත්මක පර්යේෂණ හා සංවර්ධන කළාපය, තාක්ෂණ ව්‍යවසායික කළාපය, නැනෝ තාක්ෂණ, ජෛව තාක්ෂණ ප්‍රදර්ශනාගාර කළාපය ලෙස කලාප 05 කට වෙන්කර සංවර්ධනය කිරීමට අපේක්ෂා කර තිබුණි. එම ව්‍යාපෘතිය 2017 මාර්තු 01 දින ආරම්භ කර තිබුණු අතර 2023 මාර්තු 01 දින වන විට අවසන් කිරිමට නියමිතව තිබුණි. ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරිම සඳහා අමාත්‍යාංශය හා කොරියානු රජයේ ඉඩම් යටිතල පහසුකම් හා ප්‍රවාහන අමාත්‍යාංශය සමග අවබෝධතා ගිවිසුමක් 2016 මැයි 24 දින අත්සන් කර තිබුණි. ඒ අනුව තාක්ෂණය නගර මහ සැලැස්ම හා ඊට අදාළ ශක්‍යතා අධ්‍යනයන් කිරිමේ කටයුතු කොරියානු රජයේ අදාළ අමාත්‍යාංශය වෙත භාරදී තිබුණි. කෙසේවුවද තාක්ෂණ නගර ව්‍යාපෘතිය සඳහා පිහිටුවා තිබුණු ව්‍යාපෘති කළමනාකරණ ඒකකයේ කාර්ය මණ්ඩලයට සමාලෝචිත වර්ෂය අවසන් වන විට

වැටුප් හා දීමනා ලෙස රු.මිලියන 16.64 ක් ඇතුළුව රු.මිලියන 25.49 ක් වැය කර තිබුණි. ව්‍යාපෘතිය ඉතාම මන්දගාමීව ක්‍රියාත්මක වන බව නිරීක්ෂණය විය.

### 2.2.3 අපේක්ෂිත ප්‍රතිලාභ (Outcome) ලබා නොගැනීම

---

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ)** අමාත්‍යාංශය විසින් පොදු ප්‍රවාහනය සඳහා බස්සේවාව වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය සඳහා පරිපූරක ඇස්තමේන්තු වෙන්කිරිම් මගින් රු.මිලියන 200 ක ප්‍රතිපාදන සලසා තිබුණි. සමාලෝචිත වර්ෂය අවසන් වන විට රු.මිලියන 104.04 ක් වැයකර තිබුණි. එසේම වර්ෂය අවසන් වන විට ව්‍යාපෘතිය වෙනුවෙන් රු.මිලියන 131.33 ක බැරකම්වලට එළඹ තිබුණි. ඒ අනුව වර්ෂය අවසාන වන විට එකතුව රු.මිලියන 235.37 ක් වටිනා වැඩ කොටස් ඉටු කර තිබුණි. මෙම ව්‍යාපෘතිය මගින් සමාලෝචිත වර්ෂයේදී පොදු ප්‍රවාහන සේවාව වැඩිදියුණු කිරිම සඳහා ප්‍රමුඛතා බස් මංතීරු හඳුන්වාදිමේ වැඩසටහනක් ක්‍රියාත්මක කර තිබුණි. එකී වැඩසටහන යටතේ මහජනතාව දැනුවත් කිරිමට, මංමාවත් සංවර්ධනය කිරිමට හා බස් මංතීරු සලකුණු කිරිම සඳහා සමාලෝචිත වර්ෂයේදී ඉහත සඳහන් මුදල් වැයකර තිබුණි. එහෙත් එක් දිශාවකට අවම වශයෙන් මංතීරු 03 ක් ඇතිවිට පමණක් ප්‍රමුඛතා මංතීරුවක් වෙන්කර තැබිය හැකිවීම, බොහෝ මාර්ගවල මංතීරු 03 ක් නොතිබීම, ප්‍රමුඛතා බස් මංතීරුවලට මෝටර් සයිකල්, ලොරි හා කාර් රථ ඇතුල් කිරිම හේතු කොටගෙන ප්‍රමුඛතා මංතීරු ක්‍රියාත්මක නොවීම නිසා මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී වැය කළ වියදම නිෂ්ඵල වී තිබුණි.

(ආ) බස්නාහිර කළාපයේ මහනගර සැලැසුම් කිරිමේ ව්‍යාපෘතිය 2015 මැයි මාසයේදී ආරම්භ කර තිබුණු අතර එය 2017 සැප්තැම්බර් මාසය අවසාන වන විට පුරා වර්ෂ 02 කට වැඩි කාලයක් ක්‍රියාත්මකව පැවතුණි. කෙසේවුවද, මෙම ව්‍යාපෘතිය ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සහ මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය සමග 2003, 2004 හා 2005 වර්ෂවලදී ක්‍රියාත්මකව පැවැතුණි. එම වර්ෂ 02 කට වැඩි කාලය තුළ ව්‍යාපෘතිය රු.මිලියන 79.85 ක් වැයකර තිබුණි. එකී ව්‍යාපෘතිය නැවත ආරම්භ කිරිමෙන් පසු 2015 මැයි මාසයේ සිට 2017 සැප්තැම්බර් මාසය දක්වා කාලය තුළ රු.මිලියන 250.37 ක් වැයකර තිබුණි. ඒ අනුව ව්‍යාපෘතිය වෙනුවෙන් රු.මිලියන 330.23 ක සමුච්චිත වියදමක් කර තිබුණි. වර්තමානයේදී බස්නාහිර කළාපීය මහනගර සැලැසුම් ව්‍යාපෘතිය නිමකළ යුතු කාල සීමාවක් නොදක්වා තවදුරටත් ව්‍යාපෘතිනාමය වෙනස්කර ඉදිරියට පවත්වාගෙන යන බව නිරීක්ෂණය විය.

(ඇ) කොළඹ අගනගරය වඩාත් පරිසර හිතකාමී හා අලංකාරය කිරිම සඳහා කොළඹ අගනගර ආශ්‍රිත නාගරික සංවර්ධන ව්‍යාපෘතිය මගින් බේරේ වැව සංවර්ධනය කිරිම සඳහා විවිධ කාර්යයන් වෙනුවෙන් රු.මිලියන 1,552.07 ක් වැයකර තිබුණි. භාණ්ඩාගාර අරමුදල්වලින් තවත් රු.මිලියන 470 ක් වැයකර තිබුණි. කෙසේවුවද, බේරේ වැව ආශ්‍රිත නිවාස හා හෝටල්වල අපද්‍රව්‍ය බේරේ වැවට මුසුවීම වැළැක්වීමට ක්‍රියාමාර්ග නොගැනීම නිසා බේරේ වැව අවට තද දුර්ගන්ධයක් පැවැති අතර බේරේ වැවේ සංවර්ධන කටයුතුවලින් සංචාරක ව්‍යාපාරයට සහ ශ්‍රී ලාංකිකයන්ට විවේකය ගතකිරිමට සුදුසු පරිසරයක් නිර්මාණය වී නොතිබුණි.

(ඇ) මෛත්‍රි පාලනයක් ස්ථාවර රටක් යන තේමාව යටතේ අමාත්‍යාංශය මගින් බස්නාහිර පළාත තුළ ඉදිරි දශකයේදී ගුණ නුවන ඇති පිරිසක් බිහිකිරිමේ අධ්‍යාත්මික වැඩපිළිවලට ආධාර ලෙස තෝරාගත් විහාරස්ථාන 04 ක පහසුකම් වැඩිදියුණු කිරිම සඳහා ඇස්තමේන්තු වියදම රු.මිලියන 64.22 ක් වු ඉදිකිරිම් කාර්යයන් ආරම්භ කර තිබුණි. ඒ සඳහා අත්තිකාරම් සුරක්ෂණ ඇපකරයන් ලබාගැනීමෙන් තොරව වැඩ ආරම්භ කිරිමේ අත්තිකාරම් ලෙස රු.මිලියන 7.76 ක් ගෙවා තිබුණි. එහෙත් එක් ඉදිකිරිම් කාර්යයක ඉදිකිරිමේ කටයුතු ආරම්භ

කිරීමට නියමිත දිනට මාස ගණනාවක් ගතවීමෙන් පසුද එම කටයුතු ආරම්භ කිරිමට කටයුතු කර නොතිබුණි. මේ නිසා ලබා දී තිබූ වැඩ ආරම්භ කිරිමේ අත්තිකාරම්වලින් රු.1,238,109 ක් වෙනත් ඉදිකිරිමේ කාර්යයන් 02 ක බිල්පත්වලින් අයකර ගැනීමට කටයුතු කර තිබුණි. එසේම මෙත්සිත් අරණ ව්‍යාපෘතිය යටතේ විහාරස්ථානවල පහසුකම් නැංවීම සඳහා සුබිත පුරවර ව්‍යාපෘතිය යටතේ මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශයෙන් ප්‍රතිපාදන සලසා තිබූ අතර මෙම ව්‍යාපෘතියේ කටයුතු ඉතා මන්දගාමීව ක්‍රියාත්මක වන බව නිරීක්‍ෂණය විය.

### 2.2.4 ව්‍යාපෘති ඉටුකිරීමේ ප්‍රමාදයන්

------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) කොන්ත්‍රාත්කරුගේ හැකියාවන්, කාර්යසාධනය සැලකිල්ලට ගැනීමෙන් තොරව උපායශීලි නගර සංවර්ධන ව්‍යාපෘතිය යටතේ මහනුවර වොම්ලින් උද්‍යානය වැඩි දියුණුකිරිමේ කොන්ත්‍රාත්තුව සඳහා වැඩ ආරම්භ කිරිමේ අත්තිකාරම් වශයෙන් රු.මිලියන 58.82 ක් වාරික 02 ක් යටතේ ගෙවා තිබුණි. එසේම කොන්ත්‍රාත්තුවට අදාළ මූලික නිර්මාණ සැලැසුම්වල අඩුපාඩු හේතුවෙන් රු.මිලියන 27 ක අතිරේක මුදලක් වැය කිරිමට සිදුවී තිබුණු අතර කොන්ත්‍රාත් කාලයද තවත් මාස 03 ½ කින් දීර්ඝ කිරිමට සිදුවී තිබුණි.

(ආ) ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයේ කෘෂිකර්ම, බලශක්ති හා සංචාරක කර්මාන්ත ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් මහනගර සැලැස්මක් පිළියෙල කිරීමේ ව්‍යාපෘතියක් මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය මඟින් ආරම්භකර තිබුණි. ඒ සඳහා ප්‍රසම්පාදන ක්‍රියාමාර්ග අනුගමනය කිරීමෙන් තොරව සිංගප්පූරුවේ උපදේශක සමාගමක් තෝරාගෙන තිබුණි. ත්‍රිකුණාමල දිස්ත්‍රික් මහ සැලැස්ම පිළියෙල කිරීම එක්සත් ජනපද ඩොලර් 982,000 කට සැපයීම සඳහා සමාලෝචිත වර්ෂයේදි ගිවිසුමකට එළඹ තිබුණු අතර, ගිවිසුම් ප්‍රකාරව මාස 09 ක් තුළ සැලැසුම් වාර්තාව භාරදිය යුතුව තිබුණි. එසේම සමාලෝචිත වර්ෂය අවසානය වන විට එ.ජ.ඩො. 589,200 ක් හෙවත් ශ්‍රී ලංකා රු. මිලියන 90.29 ක සමාන මුදලක් අවස්ථා 03 කදි ගෙවා තිබුණද, 2018 ජුනි මාසය අවසාන වන විටද ත්‍රිකුණාමලය දිස්ත්‍රික් මහ සැලැස්ම පිළියෙල කර භාරදි නොතිබුණි. මෙසේ උපදේශක සමාගම විසින් ගිවිසුම් ප්‍රකාරව මාස 09 ක කාලයක් තුළ සැලැස්ම පිළියෙල කිරීමට අපොහොසත් වීම මත වරින් වර අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය මඟින් යථෝක්ත කාර්ය අවසන් කිරීමට තවත් මාස 08 ක කාලයක් දිර්ඝකර තිබුණි. එහෙත් එකී කාලය තුළදී සැලැසුම් වාර්තාව පිළියෙල කර අවසන් කිරීමට අදාළ සිංගප්පූරු සමාගම අපොහොසත් වී තිබුණි. එම හේතුව මත ව්‍යාපෘතිය 2017 නොවැම්බර් 30 දින වන විට නිම කිරීමට නියමිතව තිබුණද, 2018 ජුලි 31 දින වන විටත් කාර්ය මණ්ඩලයට වැටුප් ගෙවමින් ව්‍යාපෘතිය පවත්වාගෙන යාමට සිදුවී තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේදී කොට්ටාව මාකුඹුර බහුවිධ ප්‍රවාහන මධ්‍යස්ථානය තුළ බස්රථ පාලන මෙහෙයුම් මධ්‍යස්ථානයක් ස්ථාපිත කිරීම සඳහා සියළුම පෞද්ගලික බස්රථවල ගෝලීය ස්ථානීය පද්ධතියක් (GPRS) සවිකර බස්රථ ගමන් පාලනය මෙහෙයුම් මධ්‍යස්ථානයක් ආරම්භ කිරීමට රු.මිලියන 20 ක ප්‍රතිපාදන සලසා ගෙන තිබුණි. සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් බස්රථ පාලන මෙහෙයුම් මධ්‍යස්ථානයක් ස්ථාපිත කිරීම හෝ බස්රථවල GPRS යන්ත්‍ර සවිකිරිම සිදුකර නොතිබුණි.

(ඈ) 2016 අගෝස්තු 16 දින අමාත්‍ය මණ්ඩලයේ තීරණයකින් බස්නාහිර කළාපීය මහානගර සැලැසුම් ව්‍යාපෘතියේ කටයුතු 2017 ජුලි මාසය අවසාන වන විට නිමකළ යුතුව තිබුණි. නමුත් 2017 අගෝස්තු හා සැප්තැම්බර් මාසවලදී අමාත්‍ය මණ්ඩලයේ තීරණයට පටහැනිව එම ව්‍යාපෘතියේ කාර්ය මණ්ඩලයේ වැටුප් හා අනෙකුත් වියදම් සිදු කරමින් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර තිබුණි. එම මාස 02 ක කාලය සඳහා රු.මිලියන 13.08 ක භාණ්ඩාගර ප්‍රතිපාදනද

උපයෝජනය කර තිබුණු අතර, 2017 ජුලි 11 දිනැති අමාත්‍ය මණ්ඩල සංදේශය අනුව එම ව්‍යාපෘතියේ ඉතිරි සෑම කටයුක්තක්ම බස්නාහිර කළාපීය සැලසුම් ව්‍යාපෘතිය නමින් නව ව්‍යාපෘතියක් ආරම්භ කර ඉටු කර ගැනීමට කටයුතු කර තිබුණි.

(ඉ) කොළඹ ජල ද්‍රෝණියේ පෝෂක ප්‍රදේශයේ ජල ගැලීම් අඩුකිරීම කොළඹ අගනගර ප්‍රදේශයේ පළාත් පාලන ආයතනවල ධාරිතාවය ශක්තිමත් කිරීම, කොළඹ නගරය අලංකාරය කිරීම අරමුණු කරගෙන කොළඹ අගනගර ආශ්‍රිත නාගරික සංවර්ධන ව්‍යාපෘතිය ආරම්භ කර තිබුණි. එම ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු. මිලියන 42,031.44 කට සමාන එ.ජ.ඩො. මිලියන 321 ක් වී තිබුණි. ඉන් එ.ජ.ඩො. මිලියන 213 ක් හෙවත් සියයට 66.35 ක් ප්‍රතිසංස්කරණය හා සංවර්ධනය සඳහා වූ ජාත්‍යන්තර බැංකුවද, ඉතිරි ප්‍රමාණය ශ්‍රී ලංකා රජය විසින්ද වැය කිරීමට යටත්ව මෙම ව්‍යාපෘතිය 2012 ජුලි 10 දින ආරම්භ කර 2017 ජුනි 30 දින වන විට නිමකිරීමට නියමිතව තිබුණි. එහෙත් 2020 ජුනි 30 දින දක්වා ව්‍යාපෘති කාලය දීර්ඝ කර තිබුණි. කෙසේවුවද, 2017 වර්ෂය අවසාන වන විට ලෝක බැංකු ණය යටතේ වූ අරමුදල්වලින් රු.මිලියන 12,198 කට සමාන එ.ජ.ඩො.මිලියන 87.7 ක් උපයෝජනය කර තිබූ අතර ඊට අමතරව ශ්‍රී ලංකා රජයේ අරමුදල්වලින් රු.මිලියන 3,691 ක් හෙවත් එ.ජ.ඩො.මිලියන 25.7 ක් වැයකර තිබුණි. ඒ අනුව ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර වර්ෂ 05 1/2 කට පසු ණය මුදලින් සියයට 41 කට ආසන්න ප්‍රමාණයක් පමණක් උපයෝජනය කර තිබුණි.

(ඊ) මාතර, වනාතවිල්ලුව, රත්නපුර, පුවක්පිටිය, වරාගොඩ, ගොන්ගිතොට යන ප්‍රදේශවල නගර සංවර්ධන ව්‍යාපෘති ආරම්භ කිරීම සඳහා රු.මිලියන 202.02 ක ප්‍රතිපාදන සලසා තිබුණද, සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් එම ව්‍යාපෘති ක්‍රියාත්මක කර නොතිබුණි.

(උ) 2017 වර්ෂයේදී පාදුක්ක ක්‍රීඩාංගනය, ගාලවත්ත ඉඩම් සංවර්ධන කටයුතු හා බුලත්සිංහල පොළ ඉදිකිරීම යන ඉදිකිරීම් කාර්යයන් 03 ක් සඳහා ක්‍රියාකාරි සැලැස්ම අනුව රු.මිලියන 53.24 ක ප්‍රතිපාදන සලසා තිබුණි. නමුත් එකී ඉදිකිරීම් ආරම්භ කිරීම් බොහෝ සෙයින් ප්‍රමාද කර තිබුණු අතර වැඩ අවසන් කිරීමට නියමිත දිනයන්ද ඉක්මවා තිබුණත්, එකී ඉදිකිරීම් කාර්යයන් සම්පූර්ණ කර නොතිබුණි. එබැවින් එම ඉදිකිරීම් මගින් ඒ ඒ ප්‍රදේශවල ජනතාවට ලබාගත හැකිව තිබුණු ප්‍රතිලාභ ලබා ගැනීමට වර්ෂ 02 කින් ප්‍රමාද වී තිබුණි.

**2.2.5 මුදල් නිදහස් කර තිබුණත් ප්‍රගතියක් ලබා නොතිබුණු ව්‍යාපෘති**

උපාය මාර්ගික නගර සංවර්ධන ව්‍යාපෘතිය යටතේ මහනුවර නගර සංවර්ධන ව්‍යාපෘතියෙහි මහරෝහල ධර්මාශෝක මාවත සහ කටුගස්තොට, මඩවල, දිගන මාර්ගය යන කොන්ත්‍රාත් දෙකෙහි ඉංජිනේරු ඇස්තමේන්තු පිළිවෙලින් රු. මිලියන 911 ක් හා රු.මිලියන 2,156 ක් වී තිබුණි. නමුත් එකී කොන්ත්‍රාත්තු පිළිවෙලින් රු.මිලියන 727 හා රු.මිලියන 1,615 ක් ලෙස අඩු වටිනාකම්වලට පිරිනමා තිබුණි. එම කොන්ත්‍රාත්වල ඇස්තමේන්තුගත පිරිවැය හා කොන්ත්‍රාත් පිරිනැමීම්වල වටිනාකම අතර කැපී පෙනෙන ප්‍රමාණාත්මක විචලනයන් පැවැතියත්, ඒ සම්බන්ධයෙන් වූ තොරතුරු විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි. එසේම ඉහත කොන්ත්‍රාත්තු දෙක සඳහා එකතුව රු.මිලියන 351 ක වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් කොන්ත්‍රාත්කරුවන් දෙදෙනෙකු වෙත මුදාහැර තිබුණද, සමාලෝචිත වර්ෂයේදී සියයට 30 ට වඩා අඩු ප්‍රගතියක් ලබාගෙන තිබීම හේතුවෙන් ලබාදී තිබූ අත්තිකාරම් මුදලද නැවත අයකරගැනීමට නොහැකිව තිබුණි.

### 2.2.6 කාල පමාවකින් පසුව වැඩ ආරම්භ කළ ව්‍යාපෘති

උපාය මාර්ගික නගර සංවර්ධන ව්‍යාපෘතිය යටතේ මහනුවර නගර සහා රථගාල වැඩි දියුණු කිරිමේ කොන්ත්‍රාත්තුවේ ගිවිසුම් අත්සන් කිරිමට පෙර සහ කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරිමේ ලිපිය ලබාදීමට පෙර වැඩ ආරම්භ කිරිමේ අත්තිකාරම් ලෙස රු.මිලියන 49 ක් ගෙවා තිබුණි. 2018 අප්‍රේල් 30 දින වන විටත් කොන්ත්‍රාත්තුවේ වැඩ ආරම්භ කර නොතිබුණි.

### 2.3 විදේශ ආධාර ව්‍යාපෘති

සමාලෝචිත වර්ෂයේදී අමාත්‍යාංශය විසින් විදේශ ආධාර ව්‍යාපෘති 05 ක් සඳහා රු.මිලියන 8,044.1 ක ප්‍රතිපාදන සලසා තිබුණි. සමාලෝචිත වර්ෂය අවසන් වන විට ඉන් රු.මිලියන 6,044.0 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව සලසා තිබුණු ප්‍රතිපාදනයෙන් රු.මිලියන 2000.1 ක ප්‍රතිපාදන ඉතිරි කර තිබුණි. ඒ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

#### (අ) විදේශාධාර ව්‍යාපෘතිවල කාර්යසාධනය

උපාය මාර්ගික නගර සංවර්ධන ව්‍යාපෘතිය සඳහා ණය සපයනු ලබන නියෝජිත ආයතනය විසින් වෙන් කරනු ලබන රු.මිලියන 27,507 කට සමාන එ.ජ.ඩො. මිලියන 202 ක අරමුදල් ලබා දී තිබුණි. මුළු අරමුදල්වලින් ව්‍යාපෘතිය ආරම්භ කර සමාලෝචිත වර්ෂය අවසාන වන විට වර්ෂ 03 ½ ක කාලයක් ගතවී තිබුණද, ලබා දී තිබුණු විදේශ අරමුදල්වලින් රු.මිලියන 3,431.72 ක් හෙවත් සියයට 12 ක අරමුදල් උපයෝජනය කර තිබුණි. ඒ අනුව ව්‍යාපෘතියේ කාර්යසාධනය ඉතා අඩු මට්ටමක පැවතුණි. ව්‍යාපෘතියේ ක්‍රියාකාරී සැලැසුම් මාසික, කාර්තුමය හා අර්ධ වාර්ෂික වශයෙන් වෙන් කර ගෙන පිළියෙල කර ඒ අනුව කටයුතු කර නොතිබීම ව්‍යාපෘතියේ අරමුදල් ඉතිරිවීම කෙරෙහි බලපා තිබුණි.

#### (ආ) ව්‍යාපෘති මුදල් උපයෝජනය නොකර තැන්පත් ගිණුමේ රඳවා ගැනීම

උපාය මාර්ගික නගර සංවර්ධන ව්‍යාපෘති කටයුතුවල අඩු ප්‍රගතිය සහ මූල්‍ය අවශ්‍යතාවයන් පිළිබඳව කරන ලද දුර්වල පුරෝකථනයන් හේතුවෙන් රු. මිලියන 634.5 කට සමාන එ.ජ.ඩො. මිලියන 4.26 ක් ව්‍යාපෘතියේ කටයුතු සඳහා යොදා නොගෙන මාස 06 කට වැඩි කාලයක් රඳවාගෙන තිබුණි.

#### (ඇ) ව්‍යාපෘතිය නියමිත දින ආරම්භ නොකිරීම

සමාලෝචිත වර්ෂයේදී උපාය මාර්ගික නගර සංවර්ධන ව්‍යාපෘතිය යටතේ මහනුවර, ගාල්ල හා යාපනය යන නගරවල පුනරුත්ථාපන කටයුතු සඳහා කොන්ත්‍රාත්තු 87 ක් සඳහා එකතුව රු.මිලියන 19,623 හෙවත් එ.ජ.ඩො. මිලියන 131 ක් ඇස්තමේන්තු කර තිබුණි. එම කොන්ත්‍රාත්තු 87 ඇස්තමේන්තු පිරිවැයට කොන්ත්‍රාත්කරුවන් වෙත පිරිනැමීමට සැලසුම් කර තිබූ නමුත් එයින් රු. මිලියන 8,289 ක් හෙවත් එ.ජ.ඩො. මිලියන 55.34 ක් වටිනා කොන්ත්‍රාත්තු 34 ක් පමණක් සමාලෝචිත වර්ෂය අවසාන වන විට පිරිනමා තිබුණි. කෙසේවුවද, උප ව්‍යාපෘති 25 ක කටයුතු සඳහා රු.මිලියන 1,065 ක පිරිවැයක් මත පිරිනමා තිබුණත්, එම වැඩ කටයුතු නියමිත දිනයන්හි ආරම්භ කර නොතිබුණි.

#### (ඈ) විදේශීය ව්‍යාපෘති ඇවර කිරිම

මහකොළඹ ප්‍රවාහන ජාල වැඩි දියුණු කිරිමේ ව්‍යාපෘතිය යටතේ උපසංරචකයක් ලෙස කොට්ටාව,කඩුවෙල සහ කඩවත නගර සංවර්ධන ව්‍යාපෘතිය Township Development Component (3K ව්‍යාපෘතිය) ආරම්භ කර තිබුණි. ණය ගිවිසුම අනුව 2015 මැයි 31 දින වන

විට ව්‍යාපෘතිය අවසන් කළ යුතුව තිබුණි. කෙසේවුවද, ව්‍යාපෘතිය යටතේ ඉටුකිරිමට සැලැසුම් කළ කාර්යයන් නියමිත කාලසීමාවේදී ඉටුකිරිමට අපොහොසත්වීම නිසා ණය මුදල් ලබාගැනීමෙන් තොරව භාණ්ඩාගාර ප්‍රතිපාදන මත සමාලෝචිත වර්ෂයේදී ව්‍යාපාතිය ක්‍රියාත්මක කර තිබුණි. ඒ අනුව නියමිත කාලය තුළ ව්‍යාපෘතිය අවසන් නොකිරිම නිසා කාර්ය මණ්ඩලයට මාසයකට පරිපාලන වියදම (වැටුප් හා අනෙකුත් වියදම්) දළ වශයෙන් රු.මිලියන 1.4 ක් වැය කර තිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂය අවසානය වන විට රු.මිලියන 43.4 ක පරිපාලන වියදමක් කර තිබුණත්, එම වියදම් නිෂ්ඵල වී තිබුණි.

## 2.4 ප්‍රසම්පාදන ක්‍රියාවලිය මගින් සැපයීම් හා සේවා ලබා ගැනීම

-----------------------------------------------------------

අමාත්‍යාංශය විසින් වාර්ෂික අයවැය ඇස්තමේන්තුව මගින් සලසා ගෙන තිබුණු ප්‍රතිපාදනවලින් රු.මිලියන 13.16 ක ප්‍රතිපාදන රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ සඳහන් විධිවිධාන අනුගමනය කර උපයෝජනය කළ යුතුව තිබුණි. ඉන් රු.මිලියන 11.4 ක ප්‍රතිපාදන උපයෝජනය කර තිබුණි. ඒ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2016 මාර්තු 24 දිනැති 01/2016 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයේ 8.1 ඡේදය ප්‍රකාරව, මුල්‍ය ගිවිසුමේ සහ රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශවල සඳහන් නියමයන්ට අනුකූලව උපදේශකයින් බඳවාගත යුතුව තිබුණි. එම විධිවිධාන අනුගමනය නොකර උපදේශකයින් 11 දෙනෙකු උපාය මාර්ගික නගර සංවර්ධන ව්‍යාපෘතියට බඳවාගෙන ඔවුනට වැටුප් හා දීමනා වශයෙන් එකතුව රු.මිලියන 36 ක් සමාලෝචිත වර්ෂයේදී ගෙවා තිබුණි.

(ආ) උපාය මාර්ගික නගර සංවර්ධන ව්‍යාපෘතිය සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර නොතිබීම හේතුවෙන් එ.ජ.ඩො.මිලියන 44.33 ක ඇස්තමේන්තුගත පිරිවැයක් යටතේ සමාලෝචිත වර්ෂයේ නිමකල යුතු වූ ප්‍රසම්පාදන කටයුතු 105 ක් ආරම්භ කිරිමට ව්‍යාපෘතිය අපොහොසත් වි තිබුණි.

(ඇ) ගැටඹේ ජල පිරිපහදු යන්ත්‍රාගාරය ප්‍රතිසංස්කරණය කිරිමේ කොන්ත්‍රාත්තුව රු.මිලියන 899 කට ප්‍රදානය කිරිමෙන් අනතුරුව කොන්ත්‍රාත්කරුගේ යෝග්‍යතාවය හා සුදුසුකම් පිළිබඳව ඇති වූ ගැටළු මත නැවත ලංසු කැඳවීමට ප්‍රසම්පාදන අභියාචනා කමිටුව තිරණය කර තිබුණි. එම කාර්ය සඳහා සලසා තිබුණු මුල්‍ය පහසුකම්, ණය ලබාදෙන නියෝජිත ආයතනය විසින් සම්පූර්ණයෙන්ම කපා හැර තිබීම නිසා ගැටඹේ ජල පිරිපහදු යන්ත්‍රය පිරිසිදු කිරිමේ කාර්යය නැවතී තිබුණි.

(ඈ) මහනුවර වර්ෂා ජලය බැසයාමේ කාණු පද්ධතිය රු.මිලියන 950 ක ඇස්තමේන්තුවක් අනුව ඉදිකිරිමේ කොන්ත්‍රාත්තුවේ ප්‍රසම්පාදන කටයුතු 2015 වර්ෂයේදී ආරම්භ කර තිබුණි. සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් එහි ප්‍රසම්පාදන කටයුතු අවසන් කර නොතිබුණු බැවින් කිසිදු කාර්යසාධනයක් සිදු වී නොතිබුණි.

(ඉ) කොළඹ අගනගර ආශ්‍රිතව ජල ගැලීමෙන් පසු යථා තත්ත්වයට පත්වන නාගරික පරිසරය උදෙසා වූ භාර අරමුදල යටතේ ක්‍රියාත්මක කරන ලද ගංවතුර අවදානම් තක්සේරු කිරීම හා ගංවතුර අවදානම අවම කිරිම පිළිබඳ ක්‍රියාකාරි සැලස්මක් පිළියෙල කිරිම සඳහා වූ උපදේශන සේවාව ලබා ගැනීමට අදාළ ප්‍රසම්පාදන කටයුතු සිදුකර තිබුණු අතර ඒ සඳහා වර්ෂ 02 කුත් මාස 04 ක කාලයක් ගත කර තිබුණි. එසේම කොළඹ අගනගර ආශ්‍රිත ප්‍රදේශයන්හි අභ්‍යන්තර ජලමාර්ග හා වැව්වල ගුණත්ත්වය තක්සේරු කිරීම හා තෙත්බිම් කළමනාකරණය කිරිමේ සැලැසුම් පිළියෙල කිරිමට අදාළ උපදේශන සේවාව සඳහා ප්‍රසම්පාදන කටයුතු සඳහා වර්ෂයකට වැඩි කාලයක් ගතකර තිබුණි.

(ඊ) කොළඹ අගනගර ආශ්‍රිතව ජල ගැලීමෙන් පසු යථා තත්ත්වයට පත්වන නාගරික පරිසරය උදෙසා වූ භාර අරමුදල මගින් ගංවතුර අවදානම් තක්සේරු කිරිම හා ගංවතුර අවදානම අවම

කිරිම පිළිබඳ ක්‍රියාකාරි සැලැස්මක් පිළියෙල කිරිමට උපදේශක සමාගමක් තෝරා ගැනීම සඳහා ලංසු කැඳවා තිබුණි. එම ලංසු ඇගයීමට අනුව පළමු ස්ථානයට පත් ISO 9002 නැමැති ජාත්‍යන්තර ප්‍රමිති සහතිකයද හිමිකරගෙන තිබු සහ ඉහළම සුදුසුකම් සහිත කාර්ය මණ්ඩලයක් සහිත, ජාත්‍යන්තර උපදේශන ආයතනය තෝරා ගෙන නොතිබුණි. ඒ වෙනුවට දෙවන ස්ථානයට ලකුණු ලබාගත් උපදේශන ආයතනයට කොන්ත්‍රාත්තුව පිරිනැමීම හේතුවෙන් රු.මිලියන 9.72 ක් උපදේශන ගාස්තු ලෙස වැඩිපුර ගෙවිමට සිදුවි තිබුණි. එකී උපදේශක සමාගම සඳහා 2015 ජුලි 21 දින සිට 2016 ජනවාරි 18 දින දක්වා කාලය තුළ අවස්ථා 03 කදී වාර්තාව ඉදිරිපත් කිරිමේ කාලය දීර්ඝ කර තිබුණි. මෙම හේතුව නිසා අරමුදලේ අරමුණු ඉටු කර ගැනීමට ප්‍රමාද වි තිබුණි.

## 2.5 වත්කම් කළමනාකරණය

### 2.5.1 වාහන උපයෝජනය

සමාලෝචිත වර්ෂය අවසන් වන විට අමාත්‍යාංශයේ විවිධ වර්ගයේ වාහන 35 ක් පැවැති අතර, එම වාහනවලින් කිලෝ මීටර් 535,729 ක් ධාවනය කර තිබුණි. ඒ වෙනුවෙන් ඉන්ධන හා ලිහිසි තෙල් සඳහා රු.මිලියන 1.16 ක්ද, වාහන සේවා කිරීම සඳහා රු.මිලියන 3.11 ක්ද, වාහන අළුත්වැඩියා සඳහා රු.මිලියන 2.45 ක්ද හා වාහන රක්ෂණය කිරීම සඳහා රු.මිලියන 2.67 ක්ද වශයෙන් එකතුව රු.මිලියන 9.39 ක් වැය කර තිබුණි. ඒ අනුව අමාත්‍යාංශය විසින් වාහන ධාවනය කිරිම සඳහා රියදුරු වැටුප් හා දීමනා හැර කිලෝ මීටරයක් සඳහා රු.17.53 ක් වැය කර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) උපාය මාර්ගික නගර සංවර්ධන ව්‍යාපෘතිය සඳහා කුලී පදනම මත මසකට උපරිම වශයෙන් කිලෝමීටර් 2500 ක් ධාවනය කළ හැකි වන පරිදි මෝටර් රථ ලබාගෙන තිබුණි. ඇතැම් වාහන කිලෝමීටර් 75,249 ක් නියමිත දුරට වඩා අඩුවෙන් ධාවනය කර තිබියදී කිලෝමීටර් 133,841 ක දුරක් නියමිත දුරට වඩා වැඩියෙන් ධාවනය කිරිම වෙනුවෙන් ව්‍යාපෘතිය මගින් රු.මිලියන 7.15 ක් අතිරේක වශයෙන් ගෙවා තිබුණි.

(ආ) කොළඹ අගනගර ආශ්‍රිත නාගරික සංවර්ධන ව්‍යාපෘතියේ කටයුතු සඳහා වාහන 07 ක් අනුයුක්ත කර තිබුණි. තවදුරටත් ව්‍යාපෘතියේ කටයුතු සඳහා කුලී පදනම මත වාහන 05 ක් ලබාගෙන තිබුණු අතර එකී කුලි රථ වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී රු.මිලියන 5.58 ක් වැයකර තිබුණි. ව්‍යාපෘතියේ නිලධාරින් සඳහා වාහන වෙන්කරදීම නිසා ව්‍යාපෘතියේ කටයුතු සඳහා වාහන ප්‍රමාණවත් වී නොතිබුණි. ඒ නිසා කුලී පදනම මත වාහන ලබාගැනීමට සිදුවි තිබුණි. කුලී පදනම මත වාහන ගැනීම හේතු කරගෙන සමාලෝචිත වර්ෂයේදී වාහනවල මාසික ධාවනය කිලෝමීටර් 785 ක සිට කිලෝමීටර් 1,362 ක් දක්වා පරාසයක ප්‍රමාණයක් වී තිබුණි. එසේම දිනකට ධාවනයේ සාමාන්‍ය කිලෝමීටර් 32 ක සිට කිලෝමීටර් 57 ක් දක්වා ඉතා අඩු පරාසයක පැවැතුණි.

### 2.5.2 නිෂ්ක්‍රිය හා ඌන උපයෝජිත වත්කම්

උපාය මාර්ගික නගර සංවර්ධන ව්‍යාපෘතිය යටතේ සමාලෝචිත වර්ෂයේදී රු.මිලියන 195 ක් වැය කර යන්ත්‍ර හා උපකරණ මහනුවර හා ගාල්ල මහනගර සභාවලට හා වාරිමාර්ග දෙපාර්තමේන්තුවට භාරදී තිබුණි. එම වත්කම් උපයෝජනය කිරිමේ සැලැස්මක් නොතිබීම නිසා වත්කම් මිලදීගත් අරමුණු සඳහා භාවිතා කිරිමෙන් තොරව 2018 අප්‍රේල් 30 දින වන විටත් භාර දී තිබුණු ආයතනවල ඌන උපයෝජිතව පැවැතුණි. තවද රු.මිලියන 120 ක පිරිවැයකට ඉකුත් වර්ෂයේදී මිලදී ගෙන තිබුණු ජලනල හා උපාංග තොගයක් 2018 අප්‍රේල් මාසය අවසාන වන විටත් භාවිතයට නොගෙන ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය භූමියන්හි නිෂ්කාර්යව රඳවාගෙන තිබුණි.

**2.5.3 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම**

**--------------------------------------**

බස්නාහිර කළාපීය මහනගර සැලසුම් ව්‍යාපෘති කාර්යාලය සඳහා නාගරික සංවර්ධන අධිකාරියේ අරමුදලෙන් සහ අමාත්‍යාංශයට ලැබුණු භාණ්ඩාගාර මුදල් ප්‍රයෝජනයට ගෙන රු.මිලියන 8.75 ක් වටිනා කාර්යාල උපකරණ මිලදීගෙන තිබුණි. නමුත් එකී ස්ථාවර වත්කම්, ලේඛනගත කර නොතිබුණු අතර එකී භාණ්ඩ සම්බන්ධයෙන් ඉකුත් වර්ෂයේදී හා සමාලෝචිත වර්ෂයේදී වාර්ෂික භාණ්ඩ සමීක්‍ෂණයකට භාජනය කර නොතිබුණි.

**2.5.4 බාහිර පාර්ශවයන් වෙත නිකුත් කර තිබුණු වත්කම්**

**------------------------------------------------------**

අමාත්‍යාංශය විසින් ඇතැම් වත්කම් අවිධිමත් ලෙස බාහිර පාර්ශවයන් වෙත මුදාහැර තිබුණු අවස්ථා නිරීක්ෂණය විය. ඒ පිළිබඳ විස්තර පහත දැක්වේ.

(අ) බස්නාහිර කළාපීය මහනගර සැලැසුම් ව්‍යාපෘති කාර්යාලයේ තිබුණු පරිගණක මොනිටරයක්, කැනන් වර්ගයේ පින්ටරයක්, UPS එකක් හා කැනන් වර්ගගේ ෆැක්ස් යන්ත්‍රයක් විධිමත් අනුමැතියකින් තොරව ව්‍යාපෘතිය නිමවීමෙන් පසුව හිටපු ව්‍යාපෘති සභාපතිවරයා විසින් රැගෙන ගොස් තිබුණි. ඒ සම්බන්ධයෙන් අමාත්‍යාංශය විසින් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ආ) බස්නාහිර කළාපීය මහානගර සැලැසුම් කිරිමේ ව්‍යාපෘතියේ වියදම් වාර්තාවට අනුව ව්‍යාපෘතිය වෙනුවෙන් රු.මිලියන 8.75 ක් වටිනා කාර්යාලීය උපකරණ මිලදී ගෙන තිබුණි. ව්‍යාපෘතිය විසින් පවත්වා තිබුණු ස්ථාවර වත්කම් විස්තරය අනුව එම කාර්යාලීය උපකරණවල වටිනාකම රු.මිලියන 6.03 ක් ලෙස සඳහන් කර තිබුණි. ඒ අනුව මිලදී ගෙන තිබුණු වත්කම්වල වටිනාකම රු.මිලියන 2.72 කින් අඩුවෙන් ස්ථාවර වත්කම් විස්තරයේ සටහන් කර තිබුණි.

**2.6 බැදීම් හා බැරකම්**

**------------------**

**වාර්ෂික අයවැය සීමාව ඉක්මවා බැදීම්වලට එළඹීම**

**------------------------------------------------------**

2017 අප්‍රේල් 27 දිනැති අංක 255/2017 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 02(අ) ඡේදයට පටහැනිව වැය විෂයයන් 09 ක් සඳහා සලසා තිබුණු රු.මිලියන 6,131.87ක ප්‍රතිපාදනයෙන් උපයෝජනයන් කළ පසු ඉතිරිය රු.මිලියන 450.88 කින් ඉක්මවා රු.මිලියන 2,349. 24 ක බැදීම්වලට එළඹ තිබුණි.

**2.7 පාඩු හා හානි**

**---------------**

නියැදි විගණන පරීක්ෂණවලදී අනාවරණය වූ පාඩු හා හානි පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

(අ) ශ්‍රී ලංකා රජය හා ලෝක බැංකුව විසින් ගිවිසුම් අත්සන් කර කොළඹ අගනගර ආශ්‍රිතව ජල ගැලීමෙන් පසු යථා තත්ත්වයට පත්වන නාගරික පරිසරය උදෙසා වූ භාර අරමුදල වෙනුවෙන් එ.ජ.ඩො. 900,000 ක් හෙවත් ශ්‍රී ලංකා රු. මිලියන 118.8 ක් ප්‍රදානයක් ලෙස ලැබී තිබුණි. ඉහත සඳහන් භාර අරමුදල 2012 වර්ෂයේ සිට ක්‍රියාත්මක කර තිබුණු අතර 2014 ජුලි 21 දින වන විට අවසන් කිරිමට නියමිතව තිබුණි. එම දිනයෙන් පසුව 2017 ජනවාරි 31 දින දක්වා අවස්ථා 02 කදී වර්ෂ 02 ½ කින් භාර අරමුදලේ කාලය දීර්ඝ කර තිබුණි. කෙසේවුවද, එම කාලය තුළදී භාර අරමුදලේ පැවැති මුදල් උපයෝජනය කිරිමට අපොහොසත්වීම නිසා ඒ.ජ.ඩො. 172,926.58 ක් හෙවත් ශ්‍රී ලංකා රු.මිලියන 26.55 ක් ලෝක බැංකුව වෙත ආපසු යවා තිබුණි. මේ නිසා ශ්‍රී ලංකා රජයට විදේශ විනිමය අවාසියක් සිදු වි තිබුණි.

(ආ) කොට්ටාව, කඩුවෙල, කඩවත නගර සංවර්ධන ව්‍යාපෘතියට Township Development Component (3K ව්‍යාපෘතියේ) අනුයුක්තව සිටි නිලධාරින්ට වැරදි ලෙස ගණනය කර රු.මිලියන 1.90 ක් වැටුප් වැඩිපුර ගෙවා තිබුණි. එසේ වැඩිපුර ගෙවා තිබුණු වැටුප් කාර්ය මණ්ඩලයෙන් ආපසු අයකර ගැනිමට කටයුතු නොකිරීම නිසා රජයට මූල්‍යමය පාඩුවක් සිදු වී තිබුණි.

(ඇ) අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ රියදුරු ලෙස වෙනත් අනුබද්ධ රාජ්‍ය ආයතනයක රියදුරෙකු සේවයේ යොදවා ගෙන තිබුණු අතර එකී රියදුරුට වැටුපට අමතරව විධිමත් අනුමැතියකින් තොරව සමාලෝචිත වර්ෂය අවසන් වන විට රු.423,583 ක දිමනා ගෙවා තිබුණි.

**2.8** අනාර්ථික ගනුදෙනු

---------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) උපාය මාර්ගික නගර සංවර්ධන ව්‍යාපෘතිය යටතේ ගාල්ල කොටු පවුර ප්‍රතිසංස්කරණය කිරිමේ කාර්යයේදී මූලික විමර්ශන හා පරිසර බලපෑම් පිළිබඳ ඇගයීමක් සිදු නොකර උපදේශකයන් විසින් වාර්තාව පිළියෙල කර තිබුණි. මේ හේතුව නිසා එකී වාර්තාව පදනම් කරගෙන ඉදිරි සංවර්ධන කටයුතු සහ ප්‍රතිසංස්කරණ කටයුතු සිදුකිරීමට නොහැකිවී තිබුණි. කෙසේවුවද, එම වාර්තා පිළියෙල කිරිම සඳහා උපදේශකයින්ට රු.මිලියන 60 ක නිෂ්ඵල වූ වියදමක් කර තිබුණි.

(ආ) ත්‍රිකුණාමලය දිස්ත්‍රික් මහ සැලැස්ම පිළියෙල කිරිමේ ව්‍යාපෘතියේ, ව්‍යාපෘති සම්බන්ධිකාරක ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ පැවති ක්ෂේත්‍ර රැස්වීමකට සහභාගිවීම සඳහා හෙලිකොප්ටර් යානයක් යොදාගෙන තිබුණි. එකී ගුවන් ගමන සඳහාත්, ඔහුගේ නවාතැන් ආහාරපාන හා මත්පැන් වෙනුවෙන් භාණ්ඩාගාර ප්‍රතිපාදනවලින් රු.101,622 ක් ගෙවා තිබුණි.

**2.9** විසඳා නොතිබුණු විගණන ඡේද

----------------------------------

අමාත්‍යාංශයට අදාළව විගණකාධිපති වාර්තාවල ඇතුළත්ව තිබුණු විගණන ඡේදවලින් පෙන්වා දුන් ඌනතාවයන් සම්බන්ධයෙන් අමාත්‍යාංශය විසින් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් නිවැරදි කර නොතිබුණු ඡේදවලට යොමුව පහත දැක්වේ.

| විගණකාධිපති වාර්තාවට යොමුව | | යොමුගත විෂයය |
|---|---|---|
| වර්ෂය | ඡේද අංකය | |
| 2016 | 3.5 (ආ) | පූර්ණ කාලීන හා අර්ධ කාලීන වශයෙන් ව්‍යාපෘති කාර්යයන් සඳහා මුදාහැර තිබුණු කාර්ය මණ්ඩලයට චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව සියයට 5 ක් හා සියයට 15 ක් වශයෙන් විශේෂ දීමනා හිමි නොවන නමුත් කොළඹ අගනගර ආශ්‍රිත නාගරික සංවර්ධන ව්‍යාපෘතියට අර්ධකාලීනව මුදාහැර තිබුණු කාර්යමණ්ඩලයට වැරදි ලෙස ගෙවීම් කර තිබූ එකතුව රු. මිලියන 10.83 ක දීමනාව ආපසු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| 2016 | 3.9 (අ) | කොළඹ අගනගර ආශ්‍රිත නාගරික සංවර්ධන ව්‍යාපෘතියේ හිටපු ව්‍යාපෘති අධ්‍යක්ෂවරයා එවකට අමාත්‍යාංශයේ අතිරේක ලේකම් |

(තාක්‍ෂණ) ලෙස කටයුතු කරමින් තම වැටුපට ඉන්ධන දීමනාවක් ලබාගන්නා අතරම ඔහු ව්‍යාපෘති අධ්‍යක්‍ෂවරයා ලෙස සිටි කාලය තුළ විධිමත් අනුමැතියකින් තොරව සහ චක්‍රලේඛනවලට පටහැනි ලෙස වටිනාකම රු.1,243,380 ක් වූ ඉන්ධන ලීටර් 10,812 ක ප්‍රමාණයක ඉන්ධන බිල්පත් ව්‍යාපෘතිය මගින් ප්‍රතිපූර්ණය කර තිබූ නමුදු එකී මුදල් ආපසු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

## 2.10 කළමනාකරණ දුර්වලතා

---------------------------

විධිමත් පරිදි ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ නිලධාරින් හා කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ නිලධාරින් සමග සාකච්ඡා පැවැත්වීමෙන් තොරව එකී ආයතන විසින් සිදුකරන කාර්යයන්ම ඉටු කිරිමට ගංවතුර පාලන සහ ජල සම්පත් කළමනාකරණ මධ්‍යස්ථානයක් සඳහා මහල් 12 කින් යුත් ගොඩනැගිල්ලක් කිරිමණ්ඩල මාවතේ ඉදිකිරිමට කටයුතු කර තිබුණි. කෙසේවුවද ස්ථාපිත කිරිමට යෝජිත ආයතනය සම්බන්ධයෙන් ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය සහ කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ කටයුතු සමග ගැටෙන තත්ත්වයක් තුළ ඇස්තමේන්තු පිරිවැය රු.මිලියන 1,892.68 ක් වූ ඉදිකිරිම් කාර්යය සඳහා මධ්‍යම ඉංජිනේරු උපදේශක කාර්යංශය සමග ගිවිසුම් අත්සන් කර ටැඹ (කුළුණු) ඉදිකිරිම් (Pilling) සිදුකර තිබුණි. එහෙත් ගංවතුර පාලන හා ජල සම්පත් කළමනාකරණ මධ්‍යස්ථානයක් ඉදිකිරීම අවශ්‍ය නොවන බව නිරික්ෂණය විය. එම තත්ත්වය නොසලකා ගොඩනැගිල්ල ඉදිකිරිම් ආරම්භ කිරිම නිසා එම ගොඩනැගිල්ල වෙනත් කාර්යයක් සඳහා යොදා ගැනීමට සිදුවී තිබුණු අතර භාණ්ඩාගාර මුදල් වඩාත් අත්‍යාවශ්‍ය වෙනත් කාර්යයක් සඳහා යොදවා ගැනීමට තිබුණු අවස්ථාවද අහිමි වී තිබුණි.

## 2.11 කාර්යභාරයන් ඉටු කිරිම සඳහා පාර්ලිමේන්තුව විසින් සලසා තිබුණු ප්‍රතිපාදනය උපයෝජනය කිරිම

------------------------------------------------------------------------------------------

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂ තුනක කාලය තුළ අමාත්‍යාංශයට සලසා තිබුණු ප්‍රතිපාදනය, උපයෝජනය හා ඉතිරිය පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| **වර්ෂය** | **වියදම් වර්ගය** | **ශුද්ධ ප්‍රතිපාදනය** | **උපයෝජනය** | **ඉතිරිය** | **ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස** |
|---|---|---|---|---|---|
| | | **රු.මිලියන** | **රු.මිලියන** | **රු.මිලියන** | |
| 2015 | පුනරාවර්තන | 478 | 459 | 19 | 3.97 |
| | මූලධන | 17,538 | 6,979 | 10,559 | 60.21 |
| | **එකතුව** | **18,016** | **7,438** | **10,578** | **58.71** |
| 2016 | පුනරාවර්තන | 1,066 | 750 | 316 | 29.64 |
| | මූලධන | 29,094 | 12,401 | 16,693 | 57.38 |
| | **එකතුව** | **30,160** | **13,151** | **17,009** | **56.40** |
| 2017 | පුනරාවර්තන | 2,553 | 2,527 | 26 | 1.02 |
| | මූලධන | 37,289 | 27,254 | 10,035 | 26.91 |
| | **එකතුව** | **39,842** | **29,781** | **10,061** | **25.25** |

සමාලෝචිත වර්ෂය සඳහා සලසා තිබුණු ප්‍රතිපාදනය හා උපයෝජනය සම්බන්ධයෙන් පහත සඳහන් නිරික්ෂණයන් කරනු ලැබේ.

**(අ) සලසා තිබුණු ප්‍රතිපාදන උපයෝජනය නොකිරිම**

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරික්ෂණයන් කරනු ලැබේ.

(i). වැය විෂයයන් 09 ක් සඳහා සලසා තිබුණු රු.මිලියන 1,991.5 ක් වූ මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් කිසිදු උපයෝජනයක් නොකර එම මුළු ප්‍රතිපාදනයම ඉතිරි කර තිබුණි.

(ii). අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන සුබිත පුරවර ව්‍යාපෘතිය හා පළාත් 09 හි නගර සංවර්ධන ව්‍යාපෘතිය සඳහා සමාලෝචිත වර්ෂයේදී විවිධ ව්‍යාපෘති 06 ක් සඳහා රු.මිලියන 202.02 ක ප්‍රතිපාදන සලසා තිබුණද සමාලෝචිත වර්ෂය තුළ එකී ව්‍යාපෘති කිසිවක් ආරම්භ කර නොතිබුණි.

(iii). සමාලෝචිත වර්ෂයේදී නගර සංවර්ධන හා නාගරික ඝන අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා රු. මිලියන 1,000 ක ප්‍රතිපාදන හා පරිපූරක ඇස්තමේන්තු වෙන්කිරිම් මගින් රු.මිලියන 7,895.9 ක් වශයෙන් එකතුව රු.මිලියන 8,895.9 ක ප්‍රතිපාදන සලසාගෙන තිබුණි. සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.මිලියන 3,040.56 ක් උපයෝජනය නොකර ඉතිරි කර තිබුණි.

(iv). නගර සංවර්ධන හා නාගරික ඝන අපද්‍රව්‍ය කළමනාකරණය වෙනුවෙන් ඉකුත් වර්ෂයේදී හා සමාලෝචිත වර්ෂයේදී පරිපූරක ඇස්තමේන්තු වෙන්කිරිම් මගින් පිළිවෙලින් රු.මිලියන 3,330.8 ක් හා රු.මිලියන 8,895.9 ක් වශයෙන් එකතුව රු.මිලියන 12,226.7 ක ශුද්ධ ප්‍රතිපාදනයක් සලසා තිබුණි. එහෙත් ඉකුත් වර්ෂයේදී හා සමාලෝචිත වර්ෂයේදී එම කාර්යයන් සඳහා එකතුව රු.මිලියන 9,186.14 ක් පමණක් උපයෝජනය කර තිබුණි. බස්නාහිර පළාතේ ප්‍රමුඛ හා හදිසි අවශ්‍යතාවයක් වන ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා ව්‍යාපෘතියක් හදිසි අවශ්‍යතාවක් ලෙස සලකා ආරම්භ කර නොතිබුණි.

**(ආ) අධි ප්‍රතිපාදන සලසා තිබීම**

වැය විෂයයන් 07 ක් සඳහා එකතුව රු.මිලියන 3326.8 ක අධි ප්රතිපාදන සලසා තිබීම නිසා එම වැය විෂයයන්ට අදාළ ප්‍රතිපාදනවලින් එකතුව රු.මිලියන 840.4 ක් පමණක් උපයෝජනය කිරීම නිසා ඉතිරිය සලසා තිබුණු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 52 ක සිට සියයට 98 ක් දක්වා පරාසයක ප්‍රමාණයක් වී තිබුණි.

**2.12 අනුකූල නොවීම්**

**නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම |
| --- | --- | --- |
| | රු. | |
| **(අ) ව්‍යවස්ථාපිත විධිවිධාන** | | |
| ලේකම්වරුන්ගේ ව්‍යවස්ථා සංග්‍රහයේ ආ උප ලේඛනයේ 03 ඡේදය | 2,306,255 | අමාත්‍යාංශයේ ප්‍රධාන ගණන්දීමේ නිලධාරීට වැටුප් ගෙවීමේදී ලේකම්වරුන්ගේ ව්‍යවස්ථා සංග්‍රහයේ ප්‍රතිපාදන නොසලකා, අමාත්‍ය මණ්ඩල අනුමැතියක් ලබාගැනීමෙන් තොරව අමාත්‍යාංශ ලේකම් තනතුරට පහළ ඉංජිනේරු කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යංශයේ ඉංජිනේරුවරයෙකුගේ වැටුප සහ එම ආයතනයට පමණක් ආවේණික වූ දීමනා රැසක් 2015 සැප්තැම්බර් මාසයේ සිට අවිධිමත්ව ගෙවා තිබුණි. . |
| **(ආ) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ** | | |
| (i) 2008 ජුනි 26 දිනැති අංක 13/2008 දරන චක්‍රලේඛයේ 04 හා 05 ඡේදය | 190,000 | හිටපු අතිරේක ලේකම් (නාගරික සංවර්ධන) විසින් අදාළ චක්‍රලේඛය ප්‍රකාරව තම පෞද්ගලික මෝටර් රථය රාජකාරි කටයුතු සඳහා යොදාගැනීම වෙනුවෙන් මාසිකව රු.50,000 ක ප්‍රවාහන දීමනාව ගෙවා තිබුණි. කොළඹ අගනගර නාගරික සංවර්ධන ව්‍යාපෘතියේ වාහනයක් 2015 ඔක්තෝබර් මාසයේ සිට 2016 මැයි මාසය දක්වා පූර්ණකාලීනව තමන්ගේ රාජකාරි හා පෞද්ගලික ගමන් සඳහා යොදාගෙන තිබූ බව තහවුරු වූ අතර ඔහු විසින් එය පිළිගෙන අදාල කාලය තුළ ලබා ගෙන තිබුණු රු.340,000 ක ප්‍රවාහන දිමනාවෙන් රු.150,000 ක් පමණක් ආපසු රජයට ගෙවා තිබුණි. තවදුරටත් රු.190,000 ක් රජයට ගෙවා නොතිබුණි. |
| (ii) 2016 මාර්තු 09 දිනැති අංක 05/2016 දරන චක්‍රලේඛයේ (III) , (IV) ඡේද | 2 406,580 | හිටපු අතිරේක ලේකම් (නාගරික සංවර්ධන) විසින් තම නිලයට හිමි ඉන්ධන දීමනාව ලබාගන්නා අතරම කොළඹ අගනර ආශ්‍රිත නාගරික සංවර්ධන ව්‍යාපෘතියෙන් තමන්ගේ නිල වාහනයට රු.317,350 ක් වටිනා ඉන්ධන ලීටර් 2,885 ක් සහ උපාය මාර්ගික නගර සංවර්ධන ව්‍යාපෘතියෙන් රු.147,730 ක් |

වටිනා ඉන්ධන ලීටර් 1,343 ක් ලබාගෙන තිබුණි.

(iii) 2009 අප්‍රේල් 16 දිනැති අංක-09/2009 දරන චක්‍රලේඛය

සියළුම රාජ්‍ය නිලධාරීන් තම සේවා ස්ථානයේ පැමිණීම පිටවීම ඇඟිලි සලකුණු සටහන් කිරීමේ යන්ත්‍ර මගින් සනාථ කළ යුතුව තිබුණි. එහෙත් හිටපු අතිරේක ලේකම් (නාගරික සංවර්ධන) විසින් කිසිදු දිනක පැමිණීම හා පිටවීම සටහන් කිරීම සඳහා ඇඟිලි සලකුණු යන්ත්‍ර භාවිතා කර නොතිබුණි.

**2.13**

**මානව සම්පත් කළමනාකරණය**

**අනුයුක්ත කාර්ය මණ්ඩලය, තථ්‍ය කාර්ය මණ්ඩලය හා පුද්ගල පඩිනඩි සඳහා වියදම**

2017 දෙසැම්බර් 31 දිනට අනුමත, තථ්‍ය හා පුරප්පාඩු කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර පහත දැක්වේ. (අමාත්‍යාංශය යටතේ ඇති ව්‍යාපෘතිවල කාර්යමණ්ඩලය මෙයට ඇතුළත් කර නොමැත) සමාලෝචිත වර්ෂය වෙනුවෙන් අමාත්‍යාංශය විසින් පුද්ගල පඩිනඩි වැය කාණ්ඩය වෙනුවෙන් රු. මිලියන 77.09 ක් වැය කර තිබුණි. ඒ අනුව ඒක පුද්ගල වියදම රු. 720,477 ක් වී තිබුණි.

| | **සේවක වර්ගය** | **අනුමත සේවක සංඛ්‍යාව** | **තථ්‍ය සේවක සංඛ්‍යාව** | **පුරප්පාඩු සංඛ්‍යාව** |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 36 | 31 | 05 |
| (ii) | තෘතියික මට්ටම | 06 | 02 | 04 |
| (iii) | ද්විතියික මට්ටම | 95 | 37 | 58 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 44 | 37 | 07 |
| | **එකතුව** | **181** | **107** | **74** |

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන විවිධ ව්‍යාපෘති සඳහා විධිමත් බඳවාගැනීමේ පරිපාටි අනුගමනය කිරීමෙන් තොරව සේවකයින් බඳවාගෙන තිබුණි.

(ආ) චීන ආයෝජන මත සිදුකරන මූල්‍ය නගර ව්‍යාපෘතිය (වරාය නගර ව්‍යාපෘතිය) සඳහා කාර්යමණ්ඩල බඳවාගැනීමේදී අතිරේක ව්‍යාපෘති අධ්‍යක්ෂවරුන් 05 දෙනෙකු සහ සහකාර ව්‍යාපෘති අධ්‍යක්ෂවරුන් 02 දෙනෙකු බඳවාගෙන තිබුණි. එකී බඳවාගැනීම් සඳහා විධිමත් බඳවා ගැනීමේ පරිපාටිය අනුගමනය කර නොතිබුණි. එසේම ශ්‍රී ලංකා වරාය අධිකාරියේ පූර්ණකාලීනව හාබර් මාස්ටර් යන තනතුරේ සේවය කරන නිලධාරියෙකු වෙනත් තනතුරක සේවය කිරීමට හැකියාව පිළිබඳව සොයා බැලීමකින් තොරව එකී නිලධාරියාද නියෝජ්‍ය ව්‍යාපෘති අධ්‍යක්ෂකවරයෙකු ලෙස බඳවාගෙන තිබුණි. එසේම අමාත්‍යාංශයේ අතිරේක ලේකම්වරියක, නියෝජ්‍ය ව්‍යාපෘති අධ්‍යක්ෂ ලෙසද තවත් නිලධාරිනියන් දෙදෙනෙකු සහකාර ව්‍යාපෘති අධ්‍යක්ෂ සේවයට යොදාගෙන තිබුණද ඔවුන් එම ව්‍යාපෘති තුළ කිසිදු රාජකාරි කටයුත්තක් ඉටු කර නොතිබුණි.

(ඇ) අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන සැහැල්ලු දුම්රිය සංක්‍රමණ පද්ධති ව්‍යාපෘතිය සඳහා (Light Rail Transit Project) ව්‍යාපෘති අධ්‍යක්‍ෂවරයෙකු බඳවාගැනීමේදී තනතුරු සඳහා අයදුම් කිරිමට වැඩ කරන දින 05 ක් වැනි ඉතාම සුළු කාලයක් ලබාදී තිබුණි. එහෙත් මෙම ව්‍යාපෘතිය සඳහා ඒ වන විටද ජයිකා ආයතනය විසින් ශක්‍යතා අධ්‍යනයක් සිදුකරමින් පැවති අතර හදිසියේ තනතුරු සඳහා බඳවාගැනීමට අවශ්‍යතාවයක් නොතිබුණි. එසේම තනතුරු සඳහා අයදුම්පත් කැඳවීමේදී ප්‍රවාහන හා යාන්ත්‍රික ඉංජිනේරු ක්ෂේත්‍රවල හසල දැනුමක් හා පළපුරුද්දක් ඇති පශ්චාත් උපාධි සහිත වෘත්තිකයන්ගෙන් අයදුම්පත් කැඳවා නොතිබුණි.